# 05 කොටස් මිලදී ගන්නේ කෙසේද?

මීට පෙර පරිච්ඡේදයන් තුළින් කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට පෙර සලකා බැලිය යුතු කරුණු මොනවා ද, ආයෝජක රැකවරණය කෙසේ ද, ආයෝජකයකුට මිලදී ගත හැකි කොටස් වර්ග සහ සමාගමක් කොටස් නිකුත් කරන්නේ ඇයි ද යන්න පුළුල්ව සාකච්ඡා කළෙමු. මෙහිදී මූලිකව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නේ කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට ප්‍රථමයෙන් පැමිණෙන ආයෝජකයකුට ඒ සඳහා ඇති ප්‍රධාන ක්‍රම දෙක (අවස්ථා දෙක) පිළිබඳව සාකච්ඡා කිරීමටත් ඒ සමඟ බැඳුණු අනෙකුත් අත්‍යවශ්‍ය කරුණු කාරණා පිළිබඳව ඔබව දැනුවත් කිරීමයි. සරලව පැවසුවහොත් කොටස් මිලදී ගන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කිරීමයි.

කොටස් වෙළෙඳපොළ ආයෝජනයට සම්බන්ධවීමට බලාපොරොත්තු වන ඕනෑම පුද්ගලයෙක් මුලින්ම කළ යුතු කාර්ය වන්නේ කොටස් තැරැව්කාර ආයතනයක් වෙත ගොස් කොටස් වෙළෙඳපොළ මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුමක් (CDS ගිණුමක්) නොමිලයේ ආරම්භ කිරීමයි.

මෙසේ ගිණුමක් ආරම්භ කිරීමට ආයෝජකයාගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ලියවිල්ලක් (ජල බිල්පතක්, විදුලි බිල්පතක්, දුරකථන බිල්පතක්) හොඳටම ප්‍රමාණවත් වේ. දැනට කොළඹ කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි කොටස් තැරැව්කාර සමාගම් 29 ක් ක්‍රියාත්මක වන අතර ඉන් ඕනෑම ආයතනයක් තෝරා ගැනීමට ආයෝජකයාගේ අභිමතය පරිදි අවස්ථාව සැලසී ඇත. (මෙම CDS ගිණුම සහ කොටස් තැරැව්කාර ආයතන පිළිබඳව වැඩිදුර විස්තර පසුවට සාකච්ඡා කෙරේ.) මෙම ගිණුම ආරම්භ කිරීමෙන් පසු කොටස් වෙළෙඳපොළට පිවිසීමට බලාපොරොත්තු වන ආයෝජකයකුට කොටස් මිලදී ගත හැකි ප්‍රධාන අවස්ථා දෙකක් ඇත. එනම්

1. ප්‍රාථමික වෙළෙඳපොළ හරහා කොටස් මිලදී ගැනීම සහ
2. ද්විතියික වෙළෙඳපොළ තුළින් කොටස් මිලදී ගැනීම

**ප්‍රාථමික වෙළෙඳපොළ** (Primary Market)

සමාගමක් ප්‍රථම වතාවට මහජනයාට කොටස් නිකුත් කිරීම ප්‍රාථමික වෙළෙඳපොළ ලෙස හැඳින්වේ. සමාගමක් මහජනයාට කොටස් නිකුත් කරන්නේ ඇයි ද යන වග පෙර පරිච්ඡේදයේදී සවිස්තරව පැහැදිලි කළෙමු.

සමාගමක් කොටස් නිකුත් කිරීමේ දී එම කොටස් නිකුතුව පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ජනමාධ්‍ය හරහා ලබා දේ. එවිට ආයෝජකයින් හට කොටස් නිකුතුවක් ඇති බව දැනගත හැක. එම ප්‍රචාරය හරහා සමාගම කොටස් නිකුතුව ආරම්භ කරන දිනය, අවසන් කරන දිනය වැනි දෑ පැහැදිලිව සඳහන් කරනු ලැබේ. එමෙන්ම සමාගම විසින් එම ප්‍රචාරණයේ දී කොටස් මිලදී ගැනීමට බලාපොරොත්තු වන පුද්ගලයන් හට එම කොටස් නිකුතුවට අවශ්‍ය ලිපි ලේඛන ලබාගත හැකි ස්ථාන ද සඳහන් කරයි. සමාගමක් මෙසේ කොටස් නිකුතුවක් සිදු කිරීමේ දී එම කොටස් නිකුතුවට අදාළ සියළු විස්තර සඳහන් කර පොතක් (ලේඛනයක්) නිකුත් කරයි. මෙය සංස්ථා ප්‍රකාශය (Prospectus) යනුවෙන් හඳුන්වයි. කොටස් නිකුත් කරනු ලබන සමාගම පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබාගත හැකි ආකාරයෙන් නිකුත් කරනු ලබන මෙම පොතෙහි පහත සඳහන් කරුණු ද ඇතුළත් කරනු ලබයි.

- කොටස් නිකුතුවේ විස්තර
- නිකුත් කරනු ලබන කොටස් ප්‍රමාණය සහ කොටසක් නිකුත් කරන මිල (කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත වන සමාගමක් තම සියළුම කොටස් මහජනතාවට නිකුත් කරන්නේද ඉන් කොටසක් නිකුත් කරන්නේ ද යන්න මෙහි දී සඳහන් කරනු ඇත. එමෙන්ම කොටස් මිලදී ගැනීමට බලාපොරොත්තු වන ආයෝජකයන් හට කොටසක් නිකුත් කරන්නේ කුමන මිලකට ද යන්න පිළිබඳවත් සංස්ථා ප්‍රකාශයෙහි සඳහන් කරයි.)
- කොටස් නිකුතුව ආරම්භ/අවසන් කරන දිනය (සමාගම නිකුත් කරනු ලබන කොටස් සඳහා අධි ඉල්ලුමක් ඇති වුවහොත් සමාගම විසින් සංස්ථා ප්‍රකාශයේ දක්වා ඇති දිනට ප්‍රථමව කොටස් නිකුතුව අවසන් කෙරෙනු ඇත.)
- කොටස් නිකුත් කරන්නේ ඇයි ද යන වග (මූලික කොටස් නිකුතුව හරහා රැස්කර ගන්නා අරමුදල් යොදවන්නේ සමාගමේ කුමන කටයුත්තක් සඳහා ද යන්න) විස්තර කෙරේ. පෙර පරිච්ඡේදයෙන් පසුගිය මාස කිහිපය තුළ කොටස් නිකුතූන් සිදුකළ සමාගම් කිහිපයක කොටස් නිකුත් කිරීමේ පරමාර්ථ ඔබට විස්තර කරන ලදී.
- සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර (දැනට සමාගමේ සිටින අධ්‍යක්ෂවරුන් සහ ඔවුන්ට සමාගමෙන් හිමි කොටස් හිමිකාරත්වය)
- සමාගමේ ප්‍රාග්ධනය, කොටස් ප්‍රමාණය යන විස්තර
- සමාගමේ ගිණුම් විස්තර
- කොටස් මිලදී ගතහැකි ආකාරය පිළිබඳ විස්තර
- කොටස් බෙදාහරින ආකාරය පිළිබඳ විස්තර

- සමාගමේ සේවා/භාණ්ඩ පිළිබඳ විස්තර (සමාගම දැනට නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා වර්තමාන ව්‍යාපාර කටයුතු පිළිබඳ විස්තර මෙහිදී ඇතුළත් කෙරේ.)
- සමාගමේ බැංකු/ලේකම් පිළිබඳ විස්තර
- සමාගමේ සේවා/භාණ්ඩ පිළිබඳ වෙළෙඳපොළ දත්ත
- සමාගමේ ව්‍යුහය ශාඛා ජාලය පිළිබඳ විස්තර (සමාගම හා සම්බන්ධ අනෙකුත් ආයතන සහ සමාගමේ දිස්ත්‍රික් මට්ටමින් හෝ ප්‍රාදේශීය මට්ටමින් ස්ථාපිත කොට ඇති ශාඛා නියෝජිත ආයතන ආදිය පිළිබඳ විස්තර)
- සමාගමේ කළමනාකාරීත්වය පිළිබඳ විස්තර

මෙම සංස්ථා ප්‍රකාශය කියවා බැලීමේන් පසු ආයෝජකයාට එම සමාගම පිළිබඳව සහ කොටස් නිකුතුව පිළිබඳ පුළුල් දැනුමක් සහ අවබෝධයක් ලබා ගත හැකි වේ. මෙම සංස්ථා ප්‍රකාශය සමාගම නම් කරනු ලබන ඕනෑම ස්ථානයකින් නොමිලයේ ලබාගත හැක. සාමාන්‍යයෙන් සංස්ථා ප්‍රකාශ පහත සඳහන් ස්ථානවලින් ලබාගත හැකිය.

- කොටස් නිකුත් කරන සමාගමෙන් හෝ සමාගමේ ශාඛා ජාලය හරහා
- සියළුම කොටස් තැරැව්කාර ආයතන සහ ඒවායේ ශාඛා මගින්
- කොළඹ කොටස් වෙළෙඳපොළ වෙබ් අඩවිය (www.cse.lk) මඟින්
- සමාගමේ වෙබ් අඩවියෙන්
- කොළඹ කොටස් වෙළෙඳපොළේ ශාඛා ජාලය හරහා
- සමාගම සඳහන් කරන බැංකු මගින්
- කොටස් නිකුතුවේ රෙජිස්ට්‍රාර් මගින්
- සමාගම සඳහන් කරන වෙනත් ඕනෑම ස්ථානයකින්

සංස්ථා ප්‍රකාශය තේරුම් ගැනීමට අපහසු ඕනෑම පුද්ගලයෙකුට කොටස් තැරැව්කාර ආයතනයක් මගින් ඒ පිළිබඳ වැඩිදුර විස්තර ලබාගත හැකි අතර ඔවුන් ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් ද කරනු ඇත.

මෙසේ සංස්ථා ප්‍රකාශය නිකුත් කිරීමේ දී සමාගම ඒ සංස්ථා ප්‍රකාශයත් සමඟම කොටස් අයදුම් කිරීම සඳහා අයදුම් පතක් ද නොමිලයේ ලබාදේ.

### කොටස් අයදුම් පත්‍රය (Share Application)

කොටස් අයදුම් පත්‍රය යනු කිසියම් පුද්ගලයෙකු ප්‍රාථමික නිකුතුවෙන් කොටස් ඉල්ලුම් කිරීම සඳහා පිරවිය යුතු පෝරමය (අයදුම්පත්‍රය) යි.

ආයෝජකයා විසින් මෙම අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු අතර ඒ සඳහා කොටස් තැරැව්කාර ආයතනයක සහාය ලබාගත හැක.

ආයෝජකයා විසින් එම අයදුම්පතෙහි තමාගේ නම, තමාට අවශ්‍ය කොටස් ප්‍රමාණය, තම CDS ගිණුමේ අංකය, තම ස්ථිර ලිපිනය යන කරුණු ඇතුළු අනෙකුත් ඉල්ලා ඇති කරුණු සැළකිල්ලෙන් සම්පූර්ණ කළ යුතුය. මෙසේ අයදුම්පත පිරවීමට පෙර එහි පිට පැත්තේ ඇති විධාන පැහැදිලිව කියවීම අයදුම් පත්‍රය පිරවීමට උදව් විය හැක.

අයදුම්පත පුරවා අවසන් වූ පසු තමා විසින් අයදුම් කළ කොටස් ප්‍රමාණයේ වටිනාකමට සරිලන චෙක්පතක්, මුදල් ඇණවුමක්, බැංකු ඇපකරයක් අයදුම්පත සමඟ ඇමිණිය යුතුය. උදාහරණයක් වශයෙන් තමන් විසින් අයදුම් කරන්නේ කොටස් 1,000 ක් සඳහා නම් සමාගම කොටසක් නිකුත් කරන මිල රු. 15 ක් නම් රු. 15,000 ක වටිනාකමකින් යුත් චෙක්පතක් හෝ මුදල් ඇණවුමක් ඇමිණිය යුතුය. මේ සියල්ල සිදු කිරීමෙන් පසු ආයෝජකයා විසින් අයදුම්පත කොටස් තැරැව්කාර ආයතනයකට හෝ සමාගම විසින් සංස්ථා ප්‍රකාශයේ සඳහන් කර ඇති ඕනෑම ස්ථානයකට භාර දිය හැකිය. මෙහි දී මතක තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ කොටස් අයදුම් කරන්නා විසින් කොටස් සඳහා කොටස් නිකුතුව අවසන් වීමට ප්‍රථම අයදුම් කළ යුතු බවයි. සමාගම විසින් සංස්ථා ප්‍රකාශයේ සහ කොටස් අයදුම්පත්‍රයේ කොටස් නිකුතුව ආරම්භ වන දිනය ඉතා පැහැදිලිව සඳහන් කරන අතර සාමාන්‍යයෙන් කොටස් නිකුතුව ආරම්භ වීමට සති කිහිපයකට පෙර සිටම සංස්ථා ප්‍රකාශ සහ කොටස් අයදුම් පත් ලබාගත හැක.

### කොටස් නිකුතුවක් අවසන් කළ පසු තත්ත්වය

කොටස් නිකුතුවක් අවසන් කළ පසු සමාගම විසින් කොටස් අයදුම් කළ ආයෝජකයන් සඳහා කොටස් බෙදා හරිනු ලබයි.

මූලික කොටස් නිකුතුවකදී සමාගමක් නිකුත් කළ කොටස් ප්‍රමාණයට වැඩියෙන් ආයෝජකයන් කොටස් ඉල්ලුම් කළ අවස්ථාවක තත්ත්වය පිළිබඳව ද ආයෝජකයා දැනුවත් වී සිටිය යුතුය. එවැනි කොටස් සඳහා අධි ඉල්ලුමක් පැන නැගුණ අවස්ථාවක ආයෝජකයන්ට තමන් අයදුම්කළ කොටස් මුළු ප්‍රමාණයම නොලැබී යා හැකිය. සමාගම විසින් අයදුම්කරුවන් හට අයදුම්

කළ කොටස් ප්‍රමාණයට වඩා අඩුවෙන් කොටස් ලබා දෙනු ඇත. උදාහරණයක් වශයෙන් අයදුම්කරුවෙකු කොටස් 1,000 ක් සඳහා අයදුම්කර ඇති අවස්ථාවක කොටස්වලට ඇති වූ අධි ඉල්ලුම හේතුවෙන් සමාගම සමහර විට අයදුම්කරුට කොටස් 100 ක් පමණක් ලබා දීමට ඉඩ ඇත. මෙසේ කොටස් කොපමණ ප්‍රමාණයක් ලබා දෙන්නේ ද යන්න සමාගම තීරණය කරනු ලබයි.

මෙසේ අයදුම් කළ මුළු කොටස් ප්‍රමාණයම නොලැබුණ අයදුම් කරුවන් සඳහා සමාගම විසින් නැවත ඉතුරු මුදල් ආපසු ලබා දේ. උදාහරණයක් වශයෙන් කොටස් 1,000 ක් සඳහා අයදුම් කළ ආයෝජකයකුට සමාගම විසින් ලබා දුන්නේ කොටස් 100 නම් ඉතිරි කොටස් 900 සඳහා වූ මුදල් සමාගම විසින් චෙක්පත් මගින් ආයෝජකයා වෙත නැවත ලබාදෙයි.

එමෙන්ම සමාගම ආයෝජකයා වෙත ලබා දුන් කොටස් ප්‍රමාණය ඔහුගේ/ ඇයගේ CDS ගිණුමට සෘජුවම බැර කරනු ඇත. ආයෝජකයාට තම කොටස් තැරැව්කරු ඇමතීමෙන් තමන්ට ලැබුණු කොටස් ගිණුමේ ඇත්දැයි අසා දැනගත හැක. මෙසේ ගිණුමේ තැන්පත් වූ කොටස් ආයෝජකයාට කොටස් වෙළෙඳපොළ හරහා විකිණිය හැක.

සමාගමේ කොටස්, කොටස් වෙළෙඳපොළේ ගණුදෙනු වීම ආරම්භ වන දිනය කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් ප්‍රකාශයට පත් කරනු ලබයි.

කොටස් නිකුතුව අවසන් වී ගණුදෙනු දින 21 ක් තුළ එම කොටස්, කොළඹ කොටස් වෙළෙඳපොළේ ගණුදෙනුවීම ආරම්භ වේ. එවිට එම ආයෝජකයන් හට තම කොටස් අවශ්‍ය නම් විකිණිය හැක. ඒ සඳහා තම කොටස් තැරැව්කාර ආයතනයේ සහාය ලබා ගත හැක.

මෙසේ කොටස් ගණුදෙනු ආරම්භ වු පසු එම කොටස් වල මිල ගණන් තීරණය වනුයේ එම කොටස්වලට ඇති ඉල්ලුම සහ සැපයුම අනුවය. මෙසේ ඉල්ලුම සහ සැපයුම අනුව තීරණය වූ කොටස් මිල ගණන් යටතේ ආයෝජකයන් හට කොටස් ගණුදෙනු කළ හැකි ස්ථානය කොළඹ කොටස් වෙළෙඳපොළ ලෙස අප හඳුන්වන්නෙමු. එසේම එය ද්විතීයික කොටස් වෙළෙඳපොළ යනුවෙන් ද හැඳින්වේ.

### ප්‍රාථමික වෙළෙඳපොළින් කොටස් මිල දී ගැනීමේ දී ආයෝජකයකු අත්‍යවශ්‍යයෙන්ම දැනගත යුතු කරුණු කිහිපයක්

- ආයෝජකයකු විසින් සංස්ථා ප්‍රකාශය (Prospectus) කියවා තේරුම් ගැනීම අත්‍යාවශ්‍ය වේ.

පසුගිය කාලයේදී ශ්‍රී ලංකාවේ සිදු කළ කොටස් නිකුත් කිරීම් සියල්ලටම පාහේ ඉතා විශාල මහජන උනන්දුවක් ඇති විය. නමුත් බොහෝ ආයෝජකයින් මෙසේ කොටස් නිකුත් කළ සමාගම් ප්‍රකාශයට පත් කළ සංස්ථා ප්‍රකාශය පරිහරණය කර කියවා නොතිබුණි. සංස්ථා ප්‍රකාශය නිවැරදිව කියවා හෝ අන් අයෙක් මගින් (උදාහරණයක් වශයෙන් තැරැව්කාර ආයතනයක් මගින්) ඒ පිළිබඳව අවබෝධයක් ලබාගත් අය සිටියේ ඉතාම අඩු වශයෙනි. සමහර සමාගම් නිකුත් කළ සංස්ථා ප්‍රකාශවල ඔවුන් තම කොටස් බෙදොහරින්නේ කෙසේදැයි පැහැදිලිව සඳහන් කර තිබූ අතර (උදාහරණයක් වශයෙන් තම සේවකයින්ට හා සේවා දායකයින්ට කොටස් නිකුත් කිරීමේදී ප්‍රමුඛත්වය දක්වන බව සමහර සංස්ථා ප්‍රකාශවල පැහැදිලිව සඳහන් කර තිබුණි) මෙය තේරුම් නොගත් සමහර ආයෝජකයන් ඒ පිළිබඳව නිකරුණේ කොටස් වෙළෙඳපොළට සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පැමිණිලි කළ අවස්ථා තිබුණි.

සමාගම් විසින් කොටස් නිකුත් කිරීමේදී අනුගමනය කරන පියවර ඇතුළු සියළු විස්තර සංස්ථා ප්‍රකාශයේ සඳහන් වන බැවින් කොටස් මිලදී ගැනීමට අයදුම් කිරීමට ප්‍රථමව සංස්ථා ප්‍රකාශය කියවා අවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍යවේ.

- සමාගම විසින් සිදු කරනු ලබන්නේ ''කොටස් මිලයට ගැනීමට ආරාධනාවක්'' ආයෝජකයන් වෙත කිරීමකි.

ප්‍රාථමික කොටස් වෙළෙඳපොළෙන් කොටස් නිකුත් කිරීමක දී සමාගම විසින් මහජනයා වෙත තම සමාගමේ කොටස් මිලදී ගන්නා ලෙස ආරාධනය කරයි. (It is an Offer) සමාගමේ කොටස් මිලයට ගැනීම හෝ නොගැනීම ආයෝජකයා සතු අයිතියකි. සමාගම තම කොටස් මිලයට ගන්නා ලෙස ආයෝජකයින් හට බලපෑමක් නොකරයි. සමාගමේ සංස්ථා ප්‍රකාශය කියවා බලා සමාගම පිළිබඳව සහ එහි අනාගත සැලසුම් පිළිබඳව ආයෝජකයා සෑහීමකට පත් වන්නේ නම් පමණක් කොටස් මිලයට ගැනීම සඳහා අයදුම් කළ හැක. එසේ සෑහීමකට පත් වන්නේ නැත්නම් කොටස් මිලයට ගැනීම සඳහා ආයෝජකයා හට අයදුම් නොකර සිටිය හැක.

- ප්‍රාථමික වෙළෙඳපොළ හරහා කොටස් නිකුත් කිරීමක දී කොටසක් නිකුත් කරන මිල තීරණය කරනු ලබන්නේ සමාගමයි.

ප්‍රාථමික වෙළෙඳපොළ හරහා කොටස් නිකුත් කිරීමකදී සමාගමක් තමන්ගේ කොටසක් මහජනයා හට නිකුත් කරන්නේ කුමන මිලයකට දැයි තීරණය කරනු ලබයි. එනම් කොටස් නිකුතුවක දී කොටසක් නිකුත් කරන මිල තීරණය කරනු ලබන්නේ එම සමාගමයි. එහි දී එම සමාගම් බොහෝ විට කොටසක් නිකුත් කරන මිල තීරණය කරනු ලබන්නේ එම සමාගමේ කොටසක ශුද්ධ

වත්කම් අගය (Net Asset Value) පදනම් කර ගෙනය. එහි දී සමාගම විසින් ශුද්ධ වත්කම් අගයට අමතරව සමාගමේ ඉදිරි මූල්‍ය ප්‍රවාහයන් සැලකිල්ලට ගනු ලැබේ. සමහර අවස්ථාවල දී සමාගමේ කීර්ති නාමය ද කොටසක් නිකුත් කරන මිල තීරණය කිරීමට බලපායි.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හෝ කොටස් වෙළෙඳපොළ සමාගමක කොටසක නිකුත් කරන මිල තීරණය කිරීමට සම්බන්ධ නොවන බවයි. එය සමාගමේ කාර්යභාරයකි. යම්කිසි අවස්ථාවක සමාගම කොටස් නිකුත් කිරීමක දී එහි කොටසක ශුද්ධ වත්කම් අගයට වඩා ඉතා ඉහළ මිලකට කොටස් නිකුත් කරන්නේ නම් එම අවදානම දරන්නේ ද එම සමාගමයි. මක් නිසාද යත් ආයෝජකයා විසින් කොටසක ශුද්ධ වත්කම් අගය සහ කොටසක් නිකුත් කරන මිල සසඳා බලා එම කොටස් සඳහා අයදුම් නොකර සිටීමට තීරණය කළ හැකි බැවිනි. එවිට සමාගමට තම කොටස් නිකුත් කිරීමේ දී එම මුළු කොටස් ප්‍රමාණයම මහජනයා හට නිකුත් කර ගැනීමට නොහැකි වනු ඇත. ඒ හේතුවෙන් කොටස් නිකුත් කිරීම තුළින් රැස්කර ගැනීමට බලාපොරොත්තු වූ අරමුදල් රැස්කර ගත නොහැකි වනු ඇත. ආයෝජකයකු හට සමාගමේ කොටසක ශුද්ධ වත්කම් අගය එහි සංස්ථා ප්‍රකාශය තුළින් දැන ගත හැක. ඉහතින් සඳහන් කළ ආකාරයට සංස්ථා ප්‍රකාශය පැහැදිලිව කියවීමෙන් මෙම කරුණු අවබෝධ කර ගත යුතුය.

- සමාගමේ කොටස් අයිතිකාරත්වය වෙනස් වී ඇති ආකාරය අධ්‍යයනය කළ යුතුය.

කොටස් නිකුතුවක් තුළින් කොටස් වලට අයදුම් කිරීමේ දී ආයෝජකයකු විසින් එම සමාගමේ කොටස් ව්‍යුහයට සිදු වී ඇති වෙනස්කම් (Changes to the Shareholding Structure) අවබෝධ කරගත යුතු වේ. එනම් සමාගම විසින් මහජන කොටස් නිකුතුවට පෙර පෞද්ගලික කොටස් නිකුතුවක් මගින් කොටස් නිකුත් කර ඇත්ද එසේ නම් එම කොටසක් නිකුත් කළ මිල කොපමණ ද යන කාරණා පිළිබඳව සොයා බැලීම අත්‍යාවශ්‍ය වේ.

මෙම සියළුම කාරණා ද සංස්ථා ප්‍රකාශයේ පැහැදිලිව සඳහන් වේ. එනමුත් සමහර ආයෝජකයින් මෙම කරුණු හරිහැටි කියවා නොබලා සහ අවබෝධ කර නොගෙන බොහෝ අවස්ථාවල සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට සහ කොළඹ කොටස් වෙළෙඳපොළට පැමිණිලි කරති. මෙහි දී නැවත සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ සංස්ථා ප්‍රකාශයේ සියළුම කරුණු ඇතුළත් වන අතර එම කරුණු පිළිබඳව ආයෝජකයා සෑහීමකට පත් වන්නේ නැත්නම් කොටස් වලට අයදුම් නොකර සිටීමේ පූර්ණ අයිතිය ආයෝජකයා සතු වන බවයි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් මෙම වසරේ අප්‍රේල් මස සිට බල පැවැත්වෙන පරිදි නියාමනයක් පැනවූ අතර එයට අනුව කිසියම් පොදු සමාගමක කොටස්, කොළඹ කොටස් හුවමාරුවේ ලයිස්තුගත කිරීමට වසරකට පෙර කිසියම් පුද්ගලයෙකුට වෙන්කර දී ඇත්නම් එම කොටස් එවැනි වෙන් කිරීමක් කරන ලද දිනයේ සිට වසරක කාලයක් යනතුරු ගණුදෙනු කළ නොහැකි බවට නියෝගයක් නිකුත් කරන ලදී.

- සමාගම කොටස් නිකුත් කිරීම තුළින් රැස්කර ගනු ලබන අරමුදල් යොදවන්නේ කුමන කටයුත්තක් සඳහා ද යන්න ආයෝජකයා අවබෝධකර ගත යුතු වේ.
- සමාගමේ විගණන ආයතනය විසින් පළකර ඇති විගණන වාර්තාව පිළිබඳ අවබෝධයක් ලබාගැනීම ද ආයෝජකයා සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම ස්වාධීන විගණන වාර්තාව ද සංස්ථා ප්‍රකාශයේ පැහැදිලිව දැක්වේ.
- ආයෝජකයකු හට ඉල්ලුම් කළ යුතු අවම කොටස් ප්‍රමාණය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමද ඉතා වැදගත් වේ.
- යම් හෙයකින් නිකුත් කරන මුළු කොටස් ප්‍රමාණයම සඳහා ආයෝජකයන් විසින් අයදුම් නොකළහොත් ඉතිරිවන කොටස් ප්‍රමාණය සඳහා ප්‍රාරක්ෂකයකු (Underwriter) සිටිනවා ද යන වග

ප්‍රාරක්ෂකයකු යනු සමාගමක් විසින් කොටස් නිකුත් කිරීමක දී යම් හෙයකින් ආයෝජකයන් විසින් මුළු නිකුත් කොටස් ප්‍රමාණයම සඳහා අයදුම් නොකළහොත්, එසේ අයදුම් නොකර ඉතිරි වන කොටස් ප්‍රමාණය මිලට ගන්නා ආයතනයයි. මේ සඳහා කොටස් නිකුත් කිරීමට ප්‍රථමව කොටස් නිකුත් කරන සමාගම සහ ප්‍රාරක්ෂක ආයතනය ගිවිසුමකට එළඹේ.

- මෙම කාරණාවලට අමතරව සමාගමේ ඉදිරි සැළසුම්, සමාගමේ ප්‍රධාන කොටස් හිමියන් පිළිබඳ විස්තර, සමාගම යම්කිසි ව්‍යාපාරික ආරවුලකට හෝ නීතිමය වශයෙන් වෙනත් ආරවුලකට මැදිවී සිටිනවාද යන වග, සමාගමේ කළමනාකාරීත්වය, සමාගම ව්‍යාපාරික කටයුතු කරන ක්ෂේත්‍රයේ ඔවුනගේ ක්‍රියාකාරීත්වය සහ ස්ථානය, ලාභාංශ ගෙවීමේ ප්‍රතිපත්තිය, සමාගම ඉදිරි සැළසුම් සඳහා දරන ව්‍යාපාරික අවදානම, සමාගම තම ව්‍යාපාරික කටයුතු වලදී ප්‍රධාන සැපයුම් කරුවන් සහ ගණුදෙනු කරුවන් මත යැපෙන ප්‍රමාණය, සමාගමේ ස්වාධීන අධ්‍යක්ෂකවරුන් කවුරුන්ද යන්න පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත්වේ.
- වර්තමානයේ සමහර ආයෝජකයින් ප්‍රාථමික වෙළෙඳපොළෙන් කොටස් මිලදී ගැනීමේ දී බලාපොරොත්තු වන්නේ එම කොටස්, කොළඹ

කොටස් වෙළෙඳපොළේ ගණුදෙනු ආරම්භ වූ මුල් දිනය තුළම 100% ක ලාභයක් ඇතිව විකුණා ගැනීමයි. පසුගිය වසර කිහිපය තුළ ප්‍රාථමික නිකුතූන් සිදු කළ සමහර සමාගම්වල කොටස් මිල ගණන් එහි කොටස් ගණුදෙනු ආරම්භ වූ මුල් දිනම 100% කින් පමණ ඉහළ නැගුණ අතර මේ හේතුවෙන් සෑම සමාගමකම කොටස් මිල විශාල වශයෙන් ඉහළ යනු ඇතැයි ආයෝජකයින් බලාපොරොත්තු වේ.

නමුත් මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ කොටස් වෙළෙඳපොළේ ආයෝජනය යනු දිගුකාලීන ආයෝජන මාර්ග යක් වන අතර සමහර සමාගම්වල මිල ගණන් කෙටිකාලීනව ඉහළ නොගොස් දිගුකාලීනව ඉහළ යා හැකි බවයි. එමෙන්ම සමහර අවස්ථාවලදී කොටස් මිල පහළ වැටීමට ද ඉඩ ඇත. ඔබ දිගුකාලීන බලාපොරොත්තුවෙන් ආයෝජනය කළ හොත් ඔබ හට කොටස් මිල පහළ වැටුණු අවස්ථාවකදී එම කොටස් නොවිකුණා කොටස් මිල ඉහළ නැගෙන තුරු සිටීමට හැක. ඔබ ගණුදෙනු ආරම්භ වූ මුල් දිනම ඉතා ඉහළ ලාභයක් බලාපොරොත්තුවෙන් කොටස් විකිණීම පිණිස ප්‍රාථමික වෙළෙඳපොළෙන් කොටස් මිලදී ගෙන තිබුණහොත් යම් හෙයකින් ගණුදෙනු ආරම්භ වූ මුල් දින කිහිපය තුළ කොටස් මිල පහළ වැටුණහොත්, ඔබ කොටස් මිලදී ගෙන තිබුණේ ''හදිසියකට අවශ්‍ය මුදල්'' යොදවා නම් එයින් ඔබ ගැටළුවකට මැදි වේ. ඔබ කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කළ යුත්තේ ඔබ හට ''හදිසියකට අවශ්‍ය මුදල්'' නොවන අතර ඔබගේ ඉතුරුම් වලින් යම් ප්‍රතිශතයකි.

ඉහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා සංකීර්ණ කටයුත්තක් බව සමහර අයට පෙනී යා හැකිය. නමුත් එය අපහසු දෙයක් නොවන අතර ඒ සඳහා අවශ්‍ය නම් තම තැරැව්කාර සමාගමේ උපදෙස් ලබාගෙන සිදු කිරීමට ද හැකියාව ඇත.